ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද 2022 මුදල් වර්ෂයට අදාළව ස්ථාවර නියෝග 119/(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා : අංක 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව

රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මහපෙන්වීම්	**ගණන් දීමේ නිළධාරි විසින් ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය**
පළමු කොටස	
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් නිකුත් කර තිබූ 2013.07.12 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ ලිපිය මඟින් වත්කම් වර්ගීකරණය කර ඊට අදාළ සංකේතාංක ලබා දී ඇති අතර, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව CIGAS පරිගණක වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලයක් සකසා ඇති බැවින්, එමඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙන්ම සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ද වත්කම් සියල්ල ගිණුම්ගත කර යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන බව කාරුණිකව දන්වමි.
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019.05.21 දිනැති අංක 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂයේ සිට අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගන්නා බව සඳහන් කරමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු සකස් කිරීමට සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයක්ම දැනුවත් කිරීමට කටයුතු කරඇති අතර, ඒ අනුව කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම සංචිත වාහනවල මේ වන විට රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇති බව කාරුණිකව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ දෙකක් හැර අන් සියළුම ණය ශේෂ අයවෙමින් හා අයකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. වසර විස්සකට වැඩි පහත විස්තර සඳහන් අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය අත්තිකාරම් අත්හැර දැමීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

	නිලධාරියාගේ නම / මියගිය/සේවය අතහැර දිනය / සේවය කළ ආයතනය / තනතුර / ණය ශේෂය (රු.) / ණය වර්ගය එස්.ඒ.පී.මාකෙහෙල්වල මහතා / 2001.11.02 / දි.ලේ.කාර්යාලය පොළොන්නරුව / දිස්ත්‍රික් ලේකම් / 254,645.31 / වාහන කේ.පී.ජී.ගුණතිලක මහතා / 2000.05.30 / ප්‍රා.ලේ.කා.දිඹුලාගල / කා.සේ.සේ. / 45,075.00 / ආපදා/ පාපැදි
පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතී.
දෙවන කොටස	
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වා නොතිබුණි.	මේ දක්වා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් ලබාදෙන ලද දිනවල දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පවත්වන ලද බව කාරුණිකව දන්වන ලද අතර, ඉදිරියේ දී මාසිකව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි.
දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පැවැත්වීම සඳහා ඉදිරියේ දී කටයුතු සූදානම් කරන බව සඳහන් කරමි.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි..	නිවාස ගැටළු හා අවශ්‍යතාවල දී පමණක් දිස්ත්‍රික් නිවාස කමිටුව මේ වන විට පවත්වා ඇති අතර, ඉදිරියේ දි මාසිකව පැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිළි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිළි කරන ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.
ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	දිස්ත්‍රික්කයේ පුරවැසියන්ගේ දත්ත රැස් කිරීම හා ඔවුන් වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමත්, අභ්‍යන්තර සේවා මනා කාර්යක්ෂමතාවකින් යුතු ව පවත්වා ගැනීමත් අරමුණු කර ගනිමින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ(UNDP) ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන Capacity Development of Local Government (CDLG) ව්‍යාපෘතිය යටතේ සංවර්ධිත පුරවැසි සේවා දත්ත පද්ධතිය මේ වන විට සංවර්ධනය කර ඇති අතර, මේ වන විට එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධව ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි.	පසුගිය කාලයේ පැවති කොවිඩ් වසංගතය හා ප්‍රතිපාදන සීමා කිරීම, නිලධාරීන් සීමා කර ගෙන්වීම හේතුවෙන් පුහුණුවීම් සිදු කිරීමට නොහැකි වූ අතර, මේ වන විට නිශ්චිත නිලධාරියෙකු නම් කර අදාළ කාර්යය ඉටු කෙරේ ද යන්න අධීක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව රජයේ නිලධාරීන්ගේ සේවාවට අවශ්‍ය ආයතන , ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුවීම් , ඵලදායිතා පුහුණු වැඩසටහන්, ග්‍රාම නිලධාරී පුහුණු, මූල්‍ය විගණනය හා මූල්‍ය කළමනාකරණ ආදී වැඩසටහන් සිදු කර ඇත.

හදුනාගත් කාර්ය දර්ශකයේ ලභාවීම 24%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	සහකාර දිස්ත්‍රික් ලේකම් නම් කර අදාළ කාර්යය ඉටු කෙරේ ද යන්න අධික්ෂණය කිරීමට කටයුතු යොදා ඇති අතර, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හදුනාගත් කාර්යය දර්ශක වැඩි ප්‍රතිශතයකට ළඟා කර ගැනීමට කටයුතු කරමින් පවතී.
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි.	2022 වර්ෂයට අදාළව කාර්තුවකට වරක් රැස්වී නොතිබුණු අතර, මෙවන විට නියමිත පරිදි රැස්වීම් පවත්වන බව සඳහන් කරමි.
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව දැනුවත් කර ඇත.
2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ පැවති ව්‍යසන හමුවේ කමිටු නියමිත පරිදි පවත්වා නොමැති අතර, මේ වන විට 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පසුගිය කාලයේ පැවති කොවිඩ් වසංගතය හමුවේ ක්‍රියා කිරීමට අපහසු වුව ද, මාර්ගගත ක්‍රමය යටතේ නිලධාරීන්ට අවස්ථා ලබා දී තිබුණි. ඒ අනුව 2022,2023 වර්ෂවලට අදාළව මූල්‍ය කළමනාකරණය, මූල්‍ය විගණනය, ග්‍රාම නිලධාරී ආදී පුහුණු වැඩසටහන් පවත්වා ප්‍රගතිය ඉහළ අගයකට ගෙන ඒමට කටයුතු කර ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	රජයේ ගිණුම් කාරක සභාව විසින් තවදුරටත් නොවිස දී ඇති කරුණු 03 ක් පෙන්වා දී තිබූ අතර, ඉන් 02 ක් මේ වන විට සම්පූර්ණයෙන්ම විසඳී ඇත. ඉතිරිව ඇති හිඟ නිවාස කුලී සම්බන්ධ ගැටළුවට අදාළව රු.12,800.00 ක මාසික වාරික වශයෙන් ගෙවීම් සිදු කරමින් පවතී. ඒ අනුව 2024.07.31 දින වන විට තවදුරටත් රු.64,000/= ක ශේෂයක් අයවීමට ඇති බව කාරුණිකව දන්වන අතර, 2024 දෙසැම්බර් මස වන විට එම ගැටළුව ද විසඳී අවසන් වනු ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	වර්ෂ 05 ඉක්මවූ නිලධාරීන් පිළිබඳ තොරතුරු වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර, **2024.01.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි අභ්‍යන්තර ස්ථානමාරුවීම් ද ක්‍රියාත්මක කර ඇත.
දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස්වී නොතිබුණි.	පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2021.01.02 දිනැති පරිසර වක්‍රලේඛ 01/2021 මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව දිස්ත්‍රික් පරිසර කමිටුව පවත්වන ලද බව කාරුණිකව සඳහන් කරමි.

.....

දිස්ත්‍රික් ලේකම්/දිසාපති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

අපන්න ඒකනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
පොළොන්නරුව

.....

ප්‍රධාන ගණකාධිකාරී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

එම්. තලෙයිදොසුන්දරම්
ප්‍රධාන ගණකාධිකාරී
පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යගැලීක අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය